# POLITICAL CORRECTNESS

Medhavi Weerasinghe



Nowadays Australian have gone into a ‘political correctness’ frenzy where everyone has become more careful about their language and taking more caution in order to filter it so that they are not offending anyone. The use of politically correct language has allowed us to combat discrimination and converse about topics which may have otherwise made people uncomfortable to bring up. However it may also hinder the ability for people within the community to effectively communicate with each other as it does not directly address an issue and may actually cover the truth.

Language shapes thought and thought shapes action, so if we rid our language of discriminatory terms then we are ultimately ‘cleaning’ our society of discriminatory language. In George Orwell’s ‘Politics and the English language’ he introduced the idea of ‘linguistic determination’ where he argued that “English is full of bad habits….If one gets rid of these bad habits one can think more clearly.” This means that if we do not speak using offensive terms, then our thoughts and actions would also not be discriminatory in nature, and therefore we are taking steps to prevent prejudice and improving social harmony. The most effective way to avoid using offensive lexemes is to use politically correct language which promotes equality and censors any phrases which are degrading in nature.

Politically Correct language allows us to communicate about taboo topics( which are topics that are generally considered inappropriate in certain contexts) in the public platform without offending others. There are many topics that people are uncomfortable talking about and when communicating with strangers we do not know what their capacity is in terms of conversing about different subjects and therefore we can use politically correct language to talk about possible taboo areas without being straightforward and explicit. For example people may find the semantic field of bodily functions to be uncomfortable to discuss and so therefore when excusing oneself to got to the bathroom the politically correct statement “may I got to the toilet” would be used over the more explicit and direct “I need to go poo”. Although politically correct terms may be more dense and ‘ugly ‘in nature it is better to use them than accidently offending someone. As mentioned by Polly Toynbee “inelegance is better than bile” which means that it is better to sound bad compared to acting in an offensive manner.

By using Politically Correct Language we are covering up realities and therefore we may not be taking the necessary actions required, as a result of this we may be actually offending those who we are trying to protect. For an example the politically correct term for someone who is blind is “visually impaired” which is also the same term used for someone who may have bad eyesight and has to wear glasses. By doing this we are watering down the difficulties and requirements of those who are blind. If we link this back to George Orwell’s idea of linguistic determination if we call someone ‘visually impaired’ we automatically connect them with someone who needs glasses and therefore may not provide them with adequate assistance that they require. Ben O’Neil comments that “by supressing information, the term actually encourages us to ignore any special needs a person has.” And “only by recognising the term as a euphemism and by making a separate (non-verbal) identification of the actual characteristics of the person under consideration can we act appropriately and sensitively.” This means that through our use of politically correct language we may be overlooking the extent to which a person needs our support which would ultimately hinder social harmony. However in order to be a good citizen and avoid this we must look past the terms given to certain taboo topics and see it for what it is and take actions accordingly.

Politically correct language has been instilled as a part of our vocabulary since we were young in order to avoid discrimination and offending others. However these phrases that we have rote learned may actually mean that we are not taking appropriate actions because we are covering up what is actually happening and presenting it in a way which is more ‘public friendly’.



---

37වන පිටෙන්

ගිවිසුම සේවා සහ ආයෝජන ඇතුළත් වන ආකාරයෙන් තවදුරටත් ව්‍යාප්ත කිරීම පිළිබඳ කතා බහක් ඇති විය. සේපා ගිවිසුම කරළියට එන්නේ එහි ප්‍රතිපලයක් ලෙසටය. දැන් එට්කා ලෙසින් ඉදිරියට ගෙන ඇත්තේ අන් කිසිවක් නොව සේපා නමින් සාකච්ඡාවට ලක්වූ එම ක්‍රියාවලියමය.

එට්කා සම්බන්ධයෙන් ආණ්ඩුව ප්‍රධාන වශයෙන් ඉදිරිපත් කරන අදහස වන්නේ මේ ගිවිසුම අස්සන් කිරීමෙන් පසු ඉන්දියානු ආයෝජකයෝ ලංකාවට පැමිණෙනු ඇති බව සහ ඒ හරහා අපගේ අපනයන වැඩි කරගත හැකිය යන්නයි. එමෙන්ම සේවා ක්ෂේත්‍රය ලිහිල් කළ විට ඉන්දියාවට අපගේ සේවා අපනයනය කිරීමට වැඩි අවස්ථාවක් ලැබේය යන්නයි. මේ කාරණයේ ඇත්ත කුමක්ද?

විශේෂයෙන්ම රට ආර්ථික අර්බුධයකට මුහුණ පා සිටින වෙලාවක සහ ලෝක පරිමාණයෙන් ආර්ථික අර්බුධයක් පවතින වෙලාවක මේ ආකාරයට වෙළඳාම ලිහිල් කිරීමේ ප්‍රතිවිපාක කවරේද? එට්කා වේවා වෙනත් නිදහස් වෙළඳ ගිවිසුම් වේවා ඒවායේ ඇති විශේෂත්වය වන්නේ ඒවාට එළැඹි පසු ආපසු හැරවීමට ඇති නොහැකියාවය. අපි මේ ගිවිසුම්වලට ඇතුල්වූ විට නිදහස් වෙළඳ පරිසරයකට බැඳීමක් ඇතිවේ. එහිදී ඇතිවන තත්ත්වය නැවත හැරවිය හැකි තත්ත්වයක් නොවේ.

එට්කා ගිවිසුම ආර්ථික අර්බුදයට විසඳුමක් ලෙස හැඳින්වීමට ආණ්ඩුව උත්සාහ කළද ගෝලීය පරිමාණයෙන් භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම අඩුවී ඇති සහ ගෝලීය ආර්ථික අවපාතයක් පවතින මේ අවස්ථාව තරම් වෙළඳාම ලිහිල්කරණය කිරීම සඳහා නරක අවස්ථාවක් තවත් නොමැත. මෙහිදී සිදුවිය හැක්කේ ලාබ ආනයනික භාණ්ඩවලින් ලංකාවේ වෙළඳපොල පිරීයාමය. එය සෘජුවම රටේ මහජනතාවට බලපෑ හැකිය. විශේෂයෙන්ම දේශීය වෙළඳපොල තුළ තරඟකාරිත්වය වැඩිවී වැටුප් මට්ටම් පහත දැමීම සම්බන්ධයෙන් නිෂ්පාදකයන්ට යම් තෙරපුමක් ඇති විය හැකිය. එට්කාවලට විරුද්ධව අදහස් දක්වන්නන් බොහෝ දෙනෙක් පෙන්වා දෙන්නේ මෙය වෘත්තිකයන්ට සහ හෝ යම් සීමිත කණ්ඩායම්වලට බලපාන ප්‍රශ්නයක් බවය. එහෙත් එට්කාහි බලපෑම එලෙස සීමිත පිරිසකට සීමා වන්නක් නොව කම්කරුවාගේ වැටුප්, ගොවි ජනතාවගේ නිෂ්පාදන අලෙවිය ආදී වශයෙන් පොදු ජනතාවට මුහුණ පෑමට සිදුවන ප්‍රශ්නයක් බව මගේ අදහසයි.

දැනට මුහුණ දී සිටින ආර්ථික අර්බුදයට පිළියමක් ලෙස අනුගමනය කළ යුතු තවත් ක්‍රියාමාර්ගයක් වන්නේ ජාත්‍යන්තර මුල්‍ය අරමුදලත් සමඟ එළැඹීමට නියමිත ගිවිසුමය. එමගින් ඇමරිකානු ඩොලර් බිලියන 1.5ක ණය ආධාර මුදලක් ගැනීමට බලාපොරොත්තු වෙයි. එම ණය ගැනීමත් සමඟ ලංකාවේ ආර්ථිකයේ යම් යම් වෙනස්කම් ඇතිවීමට ඉඩ තිබේ. ජාත්‍යන්තර මුල්‍ය අරමුදල ඉදිරිපත් කරන ප්‍රධානතම කොන්දේසියක් වන්නේ අපගේ අය-වැය හිඟය අඩු කරගත යුතු බවයි. අය-වැය හිඟය සහ ගෙවුම් ශේෂ හිඟය අතර වෙනසක් පවතී. නමුත් ගෙවුම් ශේෂයේ ඇතිවී තිබෙන අර්බුධයද ජාත්‍යන්තර මුල්‍ය අරමුදල අපගේ අය-වැය හිඟය පාලනය කිරීමට උපදෙස්දීමට යොදා ගනියි.

ලංකාවේ බදු ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් අඩු අගයක් නියෝජනය කරයි. රාජ්‍ය වියදමද සෙසු රටවල් හා සැසඳීමේදී එසේමය. අය-වැය හිඟය අඩු කරගැනීමට බදු වැඩි කළ යුතුයැයි ජාත්‍යන්තර මුල්‍ය අරමුදල ප්‍රකාශ කොට තිබේ. ඒ අනුව වැට් බද්ධ වැඩි කර තිබේ. නමුත් කලකට පෙර පැවැති ප්‍රාග්ධන ඉපැයුම් බද්දක් පිළිබඳ යම් සාකච්ඡාවක් තිබිණ. ප්‍රාග්ධන ඉපැයුම් බද්ද යනු ප්‍රාග්ධන වෙළඳපොලේ ඉපැයුම් වලට පනවනු ලබන බද්දකි. නමුත් මේ වන විට ඒ පිළිබඳ කිසිවෙක් හෝ කතා නොකරති. ආණ්ඩුව මෙන්ම මාධ්‍යයද ඒ ගැන නිහඬය. සිදුව ඇත්තේ මහජනතාවට ඉතාමත්ම බරපතල ආකාරයෙන් බලපාන වැට් බද්ද වැඩි කිරීම පමණි. ජාත්‍යන්තර මුල්‍ය අරමුදල සමඟ ඇතිකරගන්නා ගිවිසුම මගින් ආණ්ඩුව බලාපොරොත්තුවන තවත් දෙයක් වන්නේ ගෝලීය වශයෙන් එන ආයෝජනයන්ට රට තුළට පිවිසීම සඳහා අවශ්‍ය තෙරපුමක් ඇති කිරීමය. මේ ණය මුදල ගැනීමෙන් පසුව ලංකාවේ මුල්‍ය තත්ත්වය පිළිබඳ විශ්වාසය ඇතිවන නිසා ජාත්‍යන්තර ආයෝජන ලංකාවට එනු ඇතැයි ආණ්ඩුව බලාපොරොත්තු වෙයි. මහින්ද රාජපක්ෂ පාලනය 2009 වසරේදී අනුගමනය කළ උපාය මාර්ගය වූයේද මෙයමයි. 2009 ජුනි මාසයේදී ඩොලර් බිලියන 2.6ක මේ ආකාරයේම ණය මුදලක් මහින්ද රාජපක්ෂ ආණ්ඩුවද ජාත්‍යන්තර මුල්‍ය අරමුදලෙන් ලබාගත්තේ ඒ හරහා ගෝලීය ප්‍රාග්ධනය ළඟා කරගැනීමේ ප්‍රවේශයක් ලෙසිනි. වසර ගණනාවකට පසු විදේශ ණය අර්බුධයක් බවට පරිවර්ථනය වූයේ ඒ අනුගමනය කළ ප්‍රතිපත්තියයි. දැන් මේ ආණ්ඩුවද ඒ ක්‍රියාමාර්ගයම නැවත අනුගමනය කරමින් සිටියි. මේ හරහා සිදුවන තවත් දෙයක් වන්නේ විශේෂඥයන් කිහිප දෙනෙකුට පමණක් තීරණ ගත හැකි ප්‍රජාතන්ත්‍ර විරෝධී තත්ත්වයක් උද්ගතවීමයි. එබැවින් මෙයට අපි මුහුණ දෙන්නේ කෙසේද, මීට එරෙහි විරෝධය ගොඩනඟන්නේ කෙසේද යන්න පිළිබඳ ගැඹුරින් සිතා බැලිය යුතුය. ධනවාදය දිගු කාලීනව සමාජයේ විවිධ කොටස් එකිනෙකාට විරුද්ධව භේද කරවීය. කම්කරුවන්ට විරුද්ධව ශිෂ්‍යයන් භේද කරවීම ආදී වශයෙනි. මේ ආකාරයෙන් කල්පනා නොකර මේ ප්‍රශ්නයට සැබෑ හේතුව ගෝලීය ධනවාදය ලෙසින් හඳුනාගෙන එයට එරෙහිව සමාජය සන්ධානගත කරන්නේ කෙසේද යන්න පිළිබඳ සාකච්ඡාවක් ඇති කළ යුතුය.